# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1631/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 24/10/2024 පැය 1535

**මාධ්‍ය නිවේදනය**

**ටයිකොන්ඩෝ තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.**

ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනය මඟින් සංවිධානය කරනු ලැබූ 2024 නිදහස් කුසලාන ටයිකොන්ඩෝ ශූරතාවලිය 2024.10.22 වන දින සුගතදාස ගෘහස්ථ ක්‍රීඩා පිටියේදී පැවත්විණි.

මෙම තරඟාවලිය සඳහා දිවයින පුරා විසිරී සිටින ටයිකොන්ඩෝ ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් විශාල ප්‍රමාණයක් විවිධ බර පන්ති යටතේ තරඟ වැදුණු අතර එහිදී ශ්‍රී ලංකා පොලිසිය නියෝජනය කරමින් සහභාගී වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජයග්‍රහණ රැසක් ලබා ගන්නා ලදි.
එහදී පහත නිලධාරීන් ජයග්‍රහණ ලබා ගන්නා ලදි.

- පො.සැ 15970 හෙට්ටිආරච්චි - කළු පටි තෙවන ස්ථානය
- කා.පො.කො 12660 ආර්.එම්.ඩී රත්නායක - දෙවන ස්ථානය
- කා.පො.කො 12578 එච්.එම්. අයේෂනී - දෙවන ස්ථානය
- කා.පො.කො 12606 සී.යූ.කේ. කුමාරි - දෙවන ස්ථානය
- කා.පො.කො 12643 ඩබ්.පී.වයි. කුමාරරත්න - නිල පටි ප්‍රථම ස්ථානය

ශ්‍රී ලංකා පොලිස් ටයිකොන්ඩෝ සංගමයේ සභාපති ලෙස නියෝජ්‍ය පොලිස්පති ඒ.පී.ජේ.චන්ද්‍රකුමාර මහතා කටයුතු කරන අතර ලේකම් ලෙස කාන්තා සහකාර පොලිස් අධිකාරී නිරෝෂා කුමාරි මහත්මිය, පුහුණුකරු ලෙස පො.සැ 15970 හෙට්ටි ආරච්චි , කළමණාකරු ලෙස පොලිස් පරික්ෂක ඒ.ඩී.එස් අමරසිංහ යන මහත්වරුන් කටයුතු කරනු ලබයි.

**මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**